# 18

# අභිලේඛනවලින් හෙළිවන ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා

*එම්. කේ. අමිල ඉන්දික*

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටා තිබීම වැනි භූගෝලීය හා පාරිසරික සාධක පදනම් කරගෙන මෙරට ක්‍රිස්තු පූර්ව පළමුවන සහශ්‍රකයේ මැද භාගයේ සිට විදේශ රටවල් සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ බව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍රවලින් අනාවරණය වෙයි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වූ ආකාරය පිළිබඳ ව පුරාවිද්‍යාඥයන්ගේ මෙන් ම වෙනත් විද්වතුන්ගේ ද පුළුල් අවධානයක් යොමු වී තිබේ (පෙරේරා 1960 ; බෝපෙආරච්චි 1997 ; රණවැල්ල 1984 ; Bandaranayake 1990 ; Bopearachchi 1997, 1999, 2001 ; Fernando 1990 ; Gunawardena 1990 ; Silva and Bouzek 1900 ; Tampoe 1990 ; Weerakkodi 1986, 1997 ; Siriweera 1994). නමුත් අභිලේඛන සාධක කේන්ද්‍ර කරගෙන ආරම්භයේ සිට යටත් විජිත සමය දක්වා ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ ව සාකච්ඡා කර ඇති අවස්ථාවක් හඳුනා ගැනීම දුෂ්කරය.

ලෝකයේ සෑම ප්‍රදේශයක ම පාහේ ලේඛනය හා විදේශ වෙළඳාම අතර සම්බන්ධතාවක් දක්නට ලැබේ. වෙළඳාමේ වර්ධනය ලේඛන ක්‍රමවල ව්‍යාප්තියට බලපෑ බව පොදුවේ පිළිගත් අදහසකි : (Diringer 1968, 259). විදේශ වෙළඳාම මෙන් ම ලේඛනය ද 'නාගරිකරණය' නොඑසේ නම් 'ශිෂ්ටාචාරය' සමඟ බද්ධ වූ ප්‍රපංචයන් දෙකක් වශයෙන් හඳුනාගත හැකිය. චයිල්ඩ් මෙම කරුණු ද්විත්වය මානව ප්‍රගමනයේ වැදගත් පියවරක් වන නාගරිකත්වයේ නිර්ණායක අතරට ඇතුළත් කළේය (Childe 1979, 16). ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිතයේ ආරම්භය හා විදේශ වෙළඳාම අතර සම්බන්ධයක් පවතින බව හඳුනාගැනීමට පිළිවන. මෙරට බ්‍රාහ්මී අක්ෂර භාවිතය ක්‍රි.පූ. 500 - 600 කාලයේ දී ආරම්භ වූ බව අනුරාධපුර ඇතුළු නුවරින් හමු වූ අක්ෂර සහිත මැටි බඳුන් කැබලිවලින් අනාවරණය වෙයි (Deraniyagala 1992, 739 - 748). මෙරට ලේඛන ක්‍රමයක ආරම්භය කෙරෙහි විදේශ වෙළඳාම (විශේෂයෙන් බටහිර ආසියාව සමඟ) බලපා ඇති බවට වංශකථාවන්හි අන්තර්ගත තොරතුරු ද ආධාර කරමින් දැරණියගල විසින් අදහසක් ඉදිරිපත් කර ඇති අතර බ්‍රාහ්මී අක්ෂර මාලාව ඉන්දියාවේ සිට මුහුදු මාර්ග හරහා මෙරට ලැබුණු බව ද විශ්වාස කළ හැකිය. බ්‍රාහ්මී අක්ෂර භාවිතයට පෙර ද එයට සමකාලීන ව යම් ප්‍රමාණයකට ද භාවිත වූ



බ්‍රාහ්මී නොවන සංකේත (non scriptual graffiti) වෙළඳ ජාලයේ ව්‍යාප්තිය හා ඒ සමඟ වූ අයිතිය වාර්තාගත කිරීමේ අවශ්‍යතාව සමඟ බැඳී තිබේ. මෙම අවශ්‍යතාව මත මුලින් ම බ්‍රාහ්මී නොවන සංකේත ද ඉන්පසු ව බ්‍රාහ්මී අක්ෂර ද යොදාගෙන ඇති බව වැඩි දුරටත් පෙන්වා දී ඇත (Coningham and others 1996, 92).

ක්‍රි.පූ. 3 සියවසේ සිට ක්‍රි.ව. 15වන සියවසේ අවසානය දක්වා කාලවකවානුවට අයත් දේශීය අභිලේඛන සැලකිය යුතු ප්‍රමාණයකින් ද විදේශීය අභිලේඛන කිහිපයකින් ද ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ ව තොරතුරු අනාවරණය කරගත හැකිය. ඒ අතර බ්‍රාහ්මී, සිංහල, දෙමළ, අරාබි වැනි විවිධ ලේඛන ක්‍රම හා භාෂාවලින් ලියන ලද අභිලේඛන හමුවෙයි. මෙම ලේඛනවලින් බහුතරය වෙළඳාම හා සෘජු ව සම්බන්ධ ලේඛන නොව වෙළඳුන් හෝ වෙළඳ ශ්‍රේණි විසින් ආගමික ආයතනවලට සිදු කළ ප්‍රදානයන් වාර්තා කිරීමේ අරමුණින් රචනා කරන ලද ලේඛනයන් ය. විදේශ වෙළඳ සම්බන්ධතාවන්හි යථා ස්වරූපය පිළිබඳ ව ඉතා පැහැදිලි අදහසක් අභිලේඛනවලින් ඇති කරගැනීම අපහසු වුවද ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ වෙනත් කිසිදු මූලාශ්‍රයකින් අනාවරණය නොවන තොරතුරු රැසක් අභිලේඛන මගින් හෙළිකරගත හැකිය.

### ක්‍රි.පූ. 3 සියවස - ක්‍රි.ව. 1 සියවස

මෙම අවධියට අයත් මූල බ්‍රාහ්මී අභිලේඛන, මුද්‍රා (seals) හා මුද්‍රා සලකුණු (sealings) යනාදියෙන් විදේශ වෙළඳාම සම්බන්ධ වෙළඳුන්, වෙළඳ ශ්‍රේණි හා නාවිකයන් පිළිබඳ ව තොරතුරු අනාවරණය වෙයි. පෙරියපුලියන්කුලම, බඹරගස්තලාව, මණ්ඩගල වැනි මූල බ්‍රාහ්මී ශිලා ලිපිවල 'වණිජ' හා 'වපර' යන පදවලින් වෙළඳුන් පිළිබඳ ව සඳහන් කර ඇත (Paranavitana 1970, 28, 40, 45). මෙම වෙළඳුන් විදේශ වෙළඳාමට සම්බන්ධ වූ බවට සාධක එම අභිලේඛනවල අන්තර්ගත නො වේ. ඔවුන් අභ්‍යන්තර වෙළඳ කටයුතුවල නිරත වූ වෙළඳුන් බව සිතිය හැකිය. විදේශ වෙළඳාමට සම්බන්ධ බව නිශ්චිත හඳුනාගත හැකි දේශීය වෙළඳුන් පිළිබඳ ව මූල බ්‍රාහ්මී සෙල්ලිපිවල කරුණු දක්වා නොතිබුණ ද ඒ හා සම්බන්ධ නාවිකයන් පිළිබඳ ව අභිලේඛන කිහිපයකින් අනාවරණය වෙයි.

හගවා ලෙන ශිලාලිපිය භාරුකච්චයට නාවික ගමන්වල යෙදුණු පරුමක තනතුරක් දරූ මාල නම් නාවිකයෙකු විසින් පූජා කරන ලද ලෙනක් පිළිබඳව වාර්තා කරයි (Paranavitana 1970, 95).

"පරුමක බරුකචග නවික මලහ ලෙණෙ සගහ"

ඉන්දියාවේ බටහිර වෙරළේ පිහිටි ප්‍රසිද්ධ වරායක් වූ භාරුකච්ච වර්තමානයේ බ්‍රෝච් (Broach) යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම වරාය

පෙර අපර දෙදිග වෙළඳ කටයුතුවල ඉතා වැදගත් මධ්‍යස්ථානයක් විය. රෝමය, බටහිර ආසියාව, නැගෙනහිර අප්‍රිකාව වැනි ප්‍රදේශවලින් වෙළඳ නැව් එහි පැමිණි බවට සාධක හමුවේ. මේ අනුව ශ්‍රී ලාංකික වෙළඳුන් ද ඉන්දියාවේ බටහිර වෙරළේ වරායන්ට ගොස් ඉන්දීය වෙළඳුන් හා වෙනත් විදේශීය වෙළඳුන් සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ බව අනුමාන කිරීමට පිළිවන. විශාල රෙදිපිළි තොගයක් රැ ගෙන වෙළඳාම පිණිස ශ්‍රී ලංකාවේ සිට භාරුකච්ච වරායට ගිය වෙළෙන්දෙකු ගැන **තීර්ථකල්ප** නම් ග්‍රන්ථයේ සඳහන් වෙයි (රණවැල්ල 1984, 284).

ආණ්දියාගල සෙල් ලිපිය ඉන්දියාවේ බෝජ්පූර් ප්‍රදේශයට ගිය නාවිකයකු ගැන සඳහන් කරයි (Paranavitana 1970, 8).

"බොජකටකස නවිකස පදගඩිනි"

එම නාවිකයා විසින් පියගැට පෙළක් කරවා පූජා කර ඇති බව මෙයින් අනාවරණය වේ. ඉහත සඳහන් නාවිකයන් දෙදෙනා විසින් තම අනන්‍යතාව දැක්වීමේ දී තමන් යාත්‍රා කළ ඉන්දීය ප්‍රදේශ පිළිබඳ ව සඳහන් කිරීමට හේතු වී ඇත්තේ ඔවුන් නිතර ම හෝ වරින්වර එම ප්‍රදේශවලට නාවික ගමන්වල නිරත වීම විය යුතුය.

මීට අමතර ව පරමාකන්ද ශිලාලිපි දෙකක ද හඳගල හා මාලිගාතැන්න සෙල්ලිපිවල ද නාවිකයන් ගැන සඳහන් වේ. මාලිගාතැන්න ලෙන් ලිපියට අනුව එම ලෙන පූජා කළ පරුමක සුමනගේ පුත් පරුමක මහා අශෝක නාවිකයෙකි (කතියත පරුමක මහ අශොකහ...) (Paranavitana 1970, 76). පරමාකන්ද ලෙන් ලිපි දෙකෙන් හෙළිවන ආකාරයට එම ලෙන් පූජා කර ඇත්තේ පරුමක අභයගේ පුත්‍රයෙකු වූ පරුමක තිස්ස නම් නාවිකයෙකු විසිනි. එක් ශිලාලිපියක ඔහු ප්‍රධාන නාවිකයෙකු ('දුට නවික') වශයෙන් ද අනෙක් ලිපියේ නිර්හීත නාවිකයෙකු ලෙස ද හඳුන්වා දී ඇත (Paranavitana 1970, 83). නම සඳහන් කර නැති නාවිකයෙකුගේ මව විසින් පූජා කරන ලද ලෙනක් පිළිබඳ ව හඳගල ශිලාලිපියකින් අනාවරණය වෙයි (Paranavitana 1970, 89). පුත්තලම දිස්ත්‍රික්කයේ තෝනිගලින් හමු වූ ශිලාලිපියක නාවිකයන් දෙදෙනෙකු පිළිබඳ ව සඳහන් කර ඇත (Somadeva 2006, 59).

අනුරාධපුර ඇතුළුනුවර සල්ගහවත්ත ප්‍රදේශයේ කැණීමකින් හමු වූ මැටියෙන් කළ මුද්‍රාවක 'නවිග හෙශිහ' යන පාඨය දක්වා ඇත (Somadeva 2002,312). අදාළ මුද්‍රාව හේෂ නම් නාවිකයාගේ අනන්‍යතාව ප්‍රකට කරන්නක් බව පෙනී යයි. මෙවැනි මුද්‍රා බොහෝ අවස්ථාවල දී වෙළඳ භාණ්ඩ මුද්‍රා තැබීම සඳහා භාවිත කර තිබේ. මෙම මුද්‍රාව ද ඒ සඳහා භාවිත කරන්නට ඇතැයි අනුමාන කිරීමට පිළිවන.

ඉන්දීය මූල බ්‍රාහ්මී ලිපිවල මෙරටින් ගිය පුද්ගලයන් පිළිබඳ ව සඳහන් වීම හා සිංහල ප්‍රාකෘත පාඨ සහිත මැටි බඳුන් කැබලි එරටින්



හමුවීම දෙරට අතර පැවති වෙළඳ සම්බන්ධතා ප්‍රකට කරන වක්‍ර සාධක වශයෙන් හඳුනාගත හැකිය. තමිල්නාඩුවේ මූල බ්‍රාහ්මී සෙල්ලිපි කිහිපයක ශ්‍රී ලංකාවෙන් ගිය පුද්ගලයන් 'ඉළ කුටුම්පිකන්' හා 'ඉළ ගහපති' යන පදවලින් හඳුන්වා දී ඇත (Indrapala 2005). බ්‍රාහ්මී අක්ෂරවලින් හා සිංහල ප්‍රාකෘතයෙන් ලියූ පාඨ සහිත මැටි බඳුන් කැබලි ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ අරිකමේඩු, කොඩුමනල් හා අලගන්කුලම් යන වරායන්ගෙන් හමුවී ඇති බව මහාදේවන් සඳහන් කරයි (Bopearahchi 2001,103). මේවා ක්‍රි.පූ. 2 සියවස - ක්‍රි.ව. 1 සියවස කාලයට කාලනිර්ණය කර තිබේ. මෙම ලේඛන ශ්‍රී ලාංකික වෙළඳුන් විසින් වෙළඳ භාණ්ඩවල අයිතිය දැක්වීම සඳහා මෙරට දී හෝ ඉන්දියාවේ දී ලියන්නට ඇතැයි විශ්වාස කිරීමට පිළිවන.

දූවේගල මූල බ්‍රාහ්මී ශිලා ලිපියක 'බරත ශගරබිත' නම් පුද්ගලයෙකු විසින් පූජා කරන ලද ලෙනක් පිළිබඳ ව සඳහන් වේ (Paranavitana 1970, 21). මෙම ලිපියේ මුල් වරට සමුද්‍ර යාත්‍රාවක රූප සටහනක් ද දක්නට ලැබේ. අනුරාධපුර ඇතුළු නුවර සල්ගහවත්ත 2 (ASW 2) කැණීමේ 'I අවධියෙන්' (ක්‍රි.පූ. 360 - 190) හමුවූ අළු පැහැ මැටි බඳුන් කැබැල්ලක (fine grey ware) තනි රුවලක් සහිත මුහුදු යාත්‍රාවක කුරුටු සටහනක් දක්නට ලැබේ (Coningham and others 1996, 92). මෙම මැටි බඳුන් වර්ගය ඉන්දියාවේ ගංගා නම් ගංගා නිම්නය ආශ්‍රිත ප්‍රදේශයේ නිෂ්පාදනය කරන ලදී. එබැවින් එහි දැක්වෙන මුහුදු යාත්‍රාව සමකාලීන ව දෙරට අතර වෙළඳ සම්බන්ධතාවන්හි දී භාවිත කළ යාත්‍රාවක ස්වරූපය ප්‍රකට කරන්නක් බව විශ්වාස කළ හැකිය. සල්ගහවත්ත - 2 කැණීමේ 'I අවධිය' වන විට එයට පූර්ව අවධියට සාපේක්ෂ ව අභිලේඛන ප්‍රමාණය දහයේ සිට පණස් එක දක්වා ද සංකේත (non scriptual graffiti) තිස් එකේ සිට හැත්තෑ දෙක දක්වා ද ඉහළ යාම වෙළඳාමේ ව්‍යාප්තිය හා සංවර්ධනය හේතුවෙන් සිදුවූ බව පෙන්වා දී තිබේ (Coningham and others 1996, 92).

විදේශීය සම්භවයක් සහිත වෙළඳුන් විසින් සෙල්ලිපිවල තම අනන්‍යතාව පිළිබඳ ව සඳහන් කර ඇත. ඇතැම් අවස්ථාවල දී විදේශීය සම්භවයක් සහිත පුද්ගලයන් වෙළඳුන් බව දක්වා නොතිබුණ ද ඔවුන් මෙරටට පැමිණීමට හේතුව විදේශ වෙළඳ සම්බන්ධතා බව සිතිය හැකිය. සිතුල්පව්වේ කොරවක්ගල ශිලාලිපි තුනක ද බෝවත්තේගල ශිලාලිපියක හා කඳුරුවැව ශිලාලිපියක ද 'කබොඣියන', 'කබොඣිය' හා 'කබොඣන' යන පද දක්නට ලැබේ (Paranavitana 1970, 42,77). 'කබොඣ' යන්න පාලි, සංස්කෘත සාහිත්‍ය හා අශෝක ශිලාලිපි අනුව කාම්බෝජ වශයෙන් හඳුනාගත හැකි බව ප්‍රකාශ කරන පරණවිතාන ඔවුන්ගේ මුල්බිම කාශ්මීරයට දකුණින් පිහිටි රජෝරි ප්‍රදේශය බව පෙන්වා දෙයි (Paranavitana 1970, xci). බෝවත්තේගල ශිලාලිපියක ඔවුන්ගේ වෙළඳ ශ්‍රේණියක් පිළිබඳ ව සඳහන් වේ (Paranavitana 1970, xc, NO. 553).

"කබොඣිය මහ පුගියන මනපදශනෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ"

මෙම ලිපියට අනුව කාම්බෝජ ජාතිකයන්ගේ වෙළඳ ශ්‍රේණියක් විසින් මනාපදර්ශන නම් ලෙන පූජා කර ඇත. කඳුරුවැව ශිලාලිපියට අනුව 'ගොට' නම් වෙළඳ ශ්‍රේණියේ ප්‍රධානියා කාම්බෝජ ජාතිකයෙකි (Paranavitana 1970, xc, NO. 990). මොට්ටයාකල්ලු හා කුඩුම්බිගල ශිලා ලිපි දෙකක පිළිවෙළින් 'ඣවකනය' හා 'ඣුවය' යන පද දක්නට ලැබේ (Paranavitana 1970, xcii, NO. 487. 500). මෙම වචන දෙක ම ජාවක යන්නෙහි රූප දෙකක් වශයෙන් හඳුනාගත හැකිය. ඔවුන්ගේ මුල් භූමිය මැලේසියාව, ඉන්දුනීසියාව ප්‍රධාන අග්නිදිග ආසියානු ප්‍රදේශයයි. මෙම ශිලාලිපි ඔවුන් වෙළඳාම හා සම්බන්ධ වූ බවට ඍජු සාධක ඉදිරිපත් නොකරන නමුත් ඔවුන්ට ප්‍රාදේශීය වශයෙන් දේශපාලන බලයක් පැවති බව ඒවායින් අනාවරණය වේ. ඇතැම් විට වෙළඳ සම්බන්ධතා මුල්කරගෙන මෙරටට පැමිණ පසු ව දේශපාලන බලයක් ගොඩනගා ගත් පිරිසක් බව අනුමාන කිරීම නිවැරදි විය හැකිය. 'කබොඣ', 'ඣවක' යන පිරිස් පිළිබඳ ව සඳහන් අභිලේඛන හමු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ඊසාන දිග ප්‍රදේශයෙනි.

අභයගිරිය, පෙරියපුලියන්කුලම හා දීඝවාපී යන ස්ථානවලින් හමුවූ මූල බ්‍රාහ්මී ශිලාලිපි හතරක 'දමෙඩ' යනුවෙන් ද්‍රවිඩයන් පිළිබඳ ව සඳහන් කර ඇත (Paranavitana 1970, xc). අභයගිරි දාගැබට වයඹින් පිහිටි පර්වත ලිපියේ කාරව නම් ද්‍රවිඩ නායකයෙකු පිළිබඳ ව ('නවික කාරවහ අශනෙ') සඳහන් වෙයි (Paranavitana 1970, NO. 94). ඔහු ඍජු ව ම විදේශ වෙළඳාම හා සම්බන්ධ පුද්ගලයෙකු බවත් වෙළඳ කටයුතු හේතු කරගෙන අනුරාධපුරයට පැමිණෙන්නට ඇති බවත් පැහැදිලි වේ. පෙරියපුලියන්කුලම ශිලාලිපියකට අනුව එම ලෙන පූජා කර ඇත්තේ විශාක නම් ද්‍රවිඩ වෙළෙන්දෙකු විසිනි.

"දමෙඩ වණිඣ ගපති විශකහ ලෙණෙ"

(Paranavitana 1970, 37)

මොහු බොහෝ විට විදේශ වෙළඳාම හා සම්බන්ධ වෙළෙන්දෙකු බව අනුමාන කිරීමට පිළිවන. තිස්සමහාරාමයෙන් හමු වූ මූල බ්‍රාහ්මී අක්ෂර සහිත කාසි දෙකක දෙමළ නම් හමුවෙයි. ඒ අතරින් එක් නමක් මෙරට මූල බ්‍රාහ්මී ලිපිවල දක්නට නොලැබෙන අතර දකුණු ඉන්දීය දෙමළ බ්‍රාහ්මී ලිපිවල දැකිය හැකිය (Bopearechchi 2001, 103).

මූල බ්‍රාහ්මී සෙල්ලිපිවල 'පුග', 'පුක', 'ගොඩි', 'ගණ', 'නගරියන' යන පදවලින් වෙළඳ සමාගම් පිළිබඳ ව සඳහන් කර ඇත (Paranavitana 1970, xcix, C). ගනේකන්ද විහාරය, මහකපුගොල්ලෑව, අලියාකඩ, වැලඑල්ලුගොඩ කන්ද, කෝන්ගල, රණගිරිමඩ, අවුකන, කුඩුවිල්, වෙස්සගිරිය යන ස්ථානවලින් හමුවූ ශිලා ලිපිවල වෙළඳ ශ්‍රේණි පිළිබඳ ව සඳහන් වෙයි (Paranavitana 1970, NO. 1198, 135, 138,



726, 538, 959, 962, 1152, 86). මෙම වෙළඳ ශ්‍රේණි අභ්‍යන්තර වෙළඳ කටයුතුවල නිරත වූ දේශීය ප්‍රභවයක් සහිත ආයතන වශයෙන් හඳුනාගත හැකිය. මේවා විදේශීය වෙළඳුන් හා වෙළඳ ශ්‍රේණි සමඟ වෙළඳ සම්බන්ධතා නොපවත්වන්නට ඇතැයි විශ්වාස කිරීම අපහසුය. විශේෂයෙන් ම දේශීය නිෂ්පාදන විවිධ ප්‍රදේශවලින් මිල දී ගෙන එක්රැස් කර ගැනීමේ දී විදේශීය වෙළඳාමේ යෙදුණු දේශීය හා විදේශීය වෙළඳුන්ට මෙම ආයතනවල සහාය අවශ්‍ය වන්නට ඇත.

කුළුබඩු අපනයනය කළ වෙළඳ සමාගමකට අයත් බ්‍රාහ්මී අක්ෂර සහිත මුද්‍රාවක් තිස්සමහාරාමයේ අකුරුගොඩ ප්‍රදේශයෙන් හමු වී තිබේ (Somadeva 2002, 313, 314 ; සෝමදේව 1998, 46). මෙය ඕවලාකාර හැඩයෙන් යුත් මිලිමීටර 7ක් උසින් ද මිලි මීටර 8ක් පළලින් ද යුක්ත වන කානීලියන් මුද්‍රාවකි. එහි මිලිමීටර 1 x 1 ප්‍රමාණයේ අක්ෂරවලින් 'අටුකුරුත' යන පදය දක්වා ඇත. මෙම පදයෙන් 'කුළුබඩු' සලකුණු කරන ප්‍රධානියාගේ ඒකකය ('the spice marker master's departments') යන අරුත ප්‍රකාශ වන බව පෙන්වා දී තිබේ (Somadeva 2002, 314). මෙය කුළුබඩු වෙළඳාම සම්බන්ධ වෙළඳ සංවිධානයක පරීක්ෂකවරයාගේ මුද්‍රාවක් වන අතර කුළුබඩු නිෂ්පාදන සම්බන්ධ මුද්‍රා තැබීම් කටයුතු සඳහා භාවිත කරන්නට ඇත.

කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි වැනි මෙරට නිෂ්පාදනය කළ කුළුබඩු වර්ග විදේශ වෙළඳ කටයුතුවල දී ඉතා වැදගත් විය (Bopearachchi 1997, x). මේවා වැඩි වර්ෂාපතනයක් ඇති ඝර්ම කලාපීය ආර්ද්‍රතාව වැඩි ප්‍රදේශවල වැවෙන අතර ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ නිරිතදිග ප්‍රදේශය හා දකුණු ප්‍රදේශය ඒ අතර ප්‍රධාන වේ. ඉහත සඳහන් කළ මුද්‍රාව තැනූ කානීලියන් පාෂාණය මෙරට ස්වාභාවික ව පිහිටා නැති අතර ඉන්දියාවේ ඩෙකෑනයේ විශේෂයෙන් ම ගුජරාටයේ නිධි වශයෙන් පිහිටා තිබේ (Fernando 1994, 84). රිදීයගම හා කතරගම යන ස්ථානවලින් ද කානීලියන්වලින් තැනූ රූප හමු වී ඇත. භගවා ලෙන ශිලා ලිපියේ ගුජරාටය ආශ්‍රිත ව පිහිටි භාරුකච්ච වරාය හා සම්බන්ධ නාවිකයෙකු පිළිබඳ ව සඳහන්වීම ද මේ අතර ඉතා වැදගත් වේ (Bopearachchi and Wickremasinghe 1999).

යාපන අර්ධද්වීපයේ ආනෛකෝඩ්ඩෙයි මූල ඓතිහාසික සුසානයෙන් හමු වූ මුද්‍රාවක 'කෙවෙත' යන පදය මූල බ්‍රාහ්මී අක්ෂරවලින් සඳහන් කර ඇති අතර එය ධීවර වෘත්තිකයන්ගේ වෙළඳ සභාවක අනන්‍යතාව නියෝජනය කරන්නක් බව පෙන්වා දී ඇත (සෝමදේව 1998, 46). මෙම වෙළඳ සභාව විදේශ වෙළඳාම හා සම්බන්ධ වූ බවට ඍජු සාධක හමු නොවුව ද මනා සංවිධානාත්මක ව්‍යුහයක් යටතේ පැවති එවැනි සංගමයක් වක්‍ර ව හෝ විදේශ වෙළඳාමට සම්බන්ධ වූ බව අනුමාන කිරීමට තුඩුදෙන සාධක පවතී. යාපන අර්ධද්වීපය ආශ්‍රිත නොගැඹුරු ජලයේ විශාල වශයෙන් හක් බෙල්ලන්

දක්නට ලැබේ. මේවා ජාත්‍යන්තර වෙළඳාමේ දී ප්‍රධාන වෙළඳ භාණ්ඩ විශේෂයක් වූ බව පෙන්වා දී තිබේ (Indrapala 2005,78). හක් බෙල්ලන්ගේ කටුවලින් තැනූ වළලු මාන්තායි කැණීම්වලින් හමු වී ඇත (Fernando 1990, 84). පෝක් බොක්ක හා පේදුරු ඉවුර යන ස්ථානවල විශාල වශයෙන් මත්ස්‍යයන් ජීවත්වන මත්ස්‍ය ඉවුරු (fish banks) හමුවෙයි. වෙළඳ නැව්වලට ආහාර සැපයීමේ දී හා වරායන් ආශ්‍රිත ජනාවාසවල වෙළඳ ප්‍රජාවට හා සෙසු ජනතාවට අවශ්‍ය ආහාර නිෂ්පාදනයේ දී මත්ස්‍ය නිෂ්පාදන ඉතා වැදගත් වූ බව සිතිය හැකිය. යාපන අර්ධද්වීපය ආශ්‍රිත ව කොරල් පිහිටා ඇති අතර ටොලමි මෙරට නිෂ්පාදන අතර කොරල් පිළිබඳ ව සඳහන් කරයි (Weerakkodi 1997, 4, 5).

## ක්‍රි.ව. 1 සියවස - ක්‍රි.ව. 10 සියවස

මෙම කාලවකවානුව තුළ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම එහි වර්ධනයේ උච්චතම අවස්ථාවකට පත්විය. ක්‍රිඃවඃ 5වන සියවස වනවිට ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය බවට පත් වූ බව පෙනී යයි (බෝපෙආරච්චි 1997,25) මෙම කරුණ සනාථ කරන පුරාවිද්‍යාත්මක සාධක හා සාහිත්‍යමය සාධක සුලභ ව හඳුනාගත හැකිය (පෙරේරා 1960; රණවැල්ල 1984; Bandaranayake 1990; Bopearachchi 1997,2001; Bopearachchi and Wickremasinghe 1999; Fernando 1990; Gunawardena 1990; Silva and Bozek 1990; Tampoe 1990; Weerakkodi 1986, 1997). මීට පෙර කාලවකවානුවට හා මෙම අවධියට පසු කාලයට සාපේක්ෂ ව අභිලේඛනවලින් හෙළිවන විදේශ වෙළඳාම පිළිබඳ තොරතුරු ප්‍රමාණය පහළ මට්ටමක පවතී. දේශීය හා දකුණු ආසියානු වෙළඳුන්ට වඩා රෝම වෙළඳුන් විශේෂයෙන් ම මෙම අවධියේ වෙළඳාම වඩාත් දියුණු ව පැවති කාලයේ දී ඉන්දියානු සාගරයේ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් වැඩි බලයක් හිමිකරගෙන සිටීම මේ කෙරෙහි බලපෑ එක් සාධකයක් වන්නට ඇතැයි අනුමාන කිරීමට පිළිවන. ක්‍රි.ව. 3වන සියවස දක්වා රෝම වෙළඳුන් මෙරට සමඟ සෘජු සම්බන්ධතා පැවැත්වූ බවට ප්‍රමාණවත් සාධක හමු නො වේ (Bopearachchi 1997, xviii). එහෙත් ක්‍රි.ව. 4, 5 සියවස්වල දී ඔවුන් මෙරටට පැමිණි බවට නිශ්චිත සාධක පවතී. මෙරටින් රෝම කාසි හා ඉන්දු රෝම කාසි 200,000කට වැඩි ප්‍රමාණයක් හමු වී තිබේ (Bopearachchi 1997, xx). මේවා ප්‍රධාන වශයෙන් ම ක්‍රි.ව. 4-7 සියවස් අතර කාලයට අයත් වන අතර එම කාලවකවානුවේ දී ශ්‍රී ලංකාවේ භාවිත වූ ප්‍රධාන මූල්‍ය ඒකකය බවට පත්වී තිබූ බවට පැහැදිලි වේ මුල්වරට දියුණු වෙමින් පැවති විදේශ වෙළඳාම පාලනය කිරීම හා එමගින් රාජ්‍ය ආදායම වර්ධනය කරගැනීම සඳහා පාලකයන්ගේ සෘජු මැදිහත්වීම මෙම යුගයේ දක්නට ලැබෙන තවත් ලක්ෂණයකි. මෙම කරුණ හා රෝම වෙළඳුන්ගේ පුළුල් මැදිහත්වීම නිසා විදේශ වෙළඳාමට



සම්බන්ධ දේශීය වෙළඳුන්ට හා දකුණු ආසියානු වෙළඳුන්ට එමඟින් ලැබුණු ආර්ථික වාසි පහළ වැටීම ඔවුන්ගේ ආගමික ආයතනයන්ට ප්‍රදානයන් සිදුකිරීමේ ප්‍රවණතාව යම් ප්‍රමාණයකට පහළ වැටීමට හේතු වූ බැවින් විදේශ වෙළඳාමට සම්බන්ධ වෙළඳුන් හා වෙළඳ ශ්‍රේණි පිළිබඳ සඳහන් අභිලේඛන අඩු වී ඇති බව අනුමාන කිරීමට පිළිවන.

ක්‍රි.ව. පළමුවන සියවසට අයත් පෙරිමියන්කුලම් ශිලා ලිපියේ 'අයි සයි' නමැත්තෙකුට සේවය කළ 'නග' නම් නාවිකයෙකු පිළිබඳ ව සඳහන් වේ. පරණවිතාන 'අයි සයි' යන්න ක්‍රි.ව. පළමුවන සහස්‍රකයේ මුල් කාලයේ ජාවා සම්ප්‍රදායේ දක්වෙන 'අජි සක' යන්නට සමාන බව පෙන්වා දෙයි (Parnavitana 1983, 63). මෙම අර්ථ නිරූපණය නිවැරදි නම් ශ්‍රී ලංකාව මෙම කාලවකවානුවේ දී අග්නිදිග ආසියානු ප්‍රදේශ සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ බවට සාධකයක් වශයෙන් ඉහත අභිලේඛනය හඳුනාගත හැකිය.

I ගජබාහු රජුගේ (ක්‍රි.ව. 114 - 136) ගොඩවාය ශිලාලිපියේ එම වරායෙන් අය කළ රේගු බද්දක් පිළිබඳ ව සඳහන් වී ඇති අතර රජු විසින් එම බද්ද එම ස්ථානයේ පිහිටා තිබූ විහාරයකට ප්‍රදානය කර තිබේ (Paranavitana 1983,101).

"1. සිධම් ගොඩපවත පතනහි සු(ක) සු(රි)යි

2. රජ ගමණි අභය විහරට දිනි"

මේ අනුව මෙම ශිලාලිපිය දියුණු වෙමින් පැවති විදේශ වෙළඳාම පාලනය කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම සිදුවූ බව පෙන්නුම් කරන මුල් ම සාධකය වශයෙන් ඉතා වැදගත් වෙයි. අනුරාධපුර පාලකයන් තම පාලන මධ්‍යස්ථානයට කිලෝ මීටර සිය ගණනක් දුරින් පිහිටි දකුණු ප්‍රදේශයේ වරායන්හි ආදායම කෙරෙහි අවම වශයෙන් ක්‍රි.ව. 2වන සියවසේ පමණ සිට දැඩි අවධානයක් යොමු කර ඇති බව පැහැදිලි වේ. වරායන්හි බදු අයකරගැනීමේ අයිතිය රාජ්‍ය ඒකාධිකාරිය යටතේ පැවති බව විශ්වාස කළ හැකිය.

ගොඩපවත වරාය අනුරාධපුර යුගයේ දී ඉතා වැදගත් වරායක් වූ අතර මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වූ විශාලතම රෝම කාසි තැන්පතුව වන කාසි 30,000ක් පමණ මෙම වරායට ආසන්න ව පිහිටි ස්ථානයකින් සොයා ගෙන ඇත (Bopearachchi 1997, xiv). මෙම වරාය ආසන්නයෙන් මුහුදට වැටෙන වලවේ ගඟ ආශ්‍රිතව පිහිටි රිදීයගමින් රෝම කාසි, පබළු, කානීලියන් වැනි විදේශීය ප්‍රභවයක් සහිත පුරාවස්තු හමු වී තිබේ (Bopearachchi 2001, 100).

මන්නාරම් කච්චේරි ශිලාලිපියට අනුව ක්‍රි.ව 9වන සියවසේ දී මහාතිත්ථ වරායේ බදු අය කිරීමට 'මහපුටු ලද්දා' නම් රාජ්‍ය නිලධාරියෙකු පත් කර තිබුණි (EZ III, 104). මාන්තායි, මාතොට, මහපුටු, මාන්තෝට්ටම්, මහාතිත්ථ යන නම්වලින් හඳුන්වනු ලබන මෙම වරාය අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරාය විය

(Fernando 1990, 117; පෙරේරා 1960, 80). මෙම ස්ථානයේ සිදු කළ කැණීම්වලින් චීන මැටි බඳුන්, රෝම, අරිකමේඩු හා පර්සියන් මැටි බඳුන්, ඇෆ්ඝනිස්ථානයේ ලැපිස් ලැසුලි, ඩෙකානයේ කානීලියන් වැනි විදේශීය සම්භවයක් සහිත පුරාවස්තු රැසක් හමු වී තිබේ. (Silva and Bouzek 1990; Fernando 1990; පෙරේරා 1960). ක්‍රි.ව. 1990 දී මෙහි සිදු කළ කැණීමකින් හමු වූ ක්‍රි.ව. 6-7 සියවස්වලට අයත් මැටි බඳුනක පර්සියානු අක්ෂර දැකිය හැකිය. එහි එයට අමතර ව මොල්ලියක් සහිත ඔටුවන් දෙදෙනෙකුගේ රූප ද නෙස්ටෝරියානු කුරුසයක් ද දක්වා ඇත (Bopearachchi 2001, 107). මෙම අභිලේඛනය පර්සියාව සමඟ පැවති වෙළඳ සම්බන්ධතා ප්‍රකට කරන අභිලේඛනමය සාධකයක් වශයෙන් හඳුනාගත හැකිය. මෙම අවධියට සමකාලීන ව විසූ කොස්මස් මෙරට නෙස්ටෝරියන් සමාජයක් පැවති බව ප්‍රකාශ කරන අතර මෙය පර්සියානු වෙළඳුන්ගෙන් සමන්විත වූවක් බව විශ්වාස කරනු ලැබේ (Fernando 1990, 117).

යාපනයේ කන්තරෝඩෙයි ප්‍රදේශයෙන් හමුවූ රතු කානීලියන් මුද්‍රාවක (දිග සෙන්ටිමීටර 1.02 හා පළල සෙන්ටිමීටර 1) 'විෂ්ණුභූතිය' යන පාඨය දක්නට ලැබේ (Indrapala 2005, 323). මෙම සංස්කෘත නාමය සම්බන්ධ විභක්තියෙන් දක්වා ඇති අතර එමගින් අදාළ මුද්‍රාව විෂ්ණුභූති නමැත්තෙකුගේ අනන්‍යතාව නියෝජනය කරන්නක් බව හඳුනාගත හැකිය. මෙහි අක්ෂර ක්‍රි.ව. 3 හෝ 4 සියවස්වල නාගර්ජුනකොණ්ඩයේ ශිලාලිපිවලට සමාන වේ. ඇතැම් විට එම ප්‍රදේශයේ සිට උක්ත කාලවකවානුව තුළ දී මෙම මුද්‍රාව මෙරටට රැගෙන එන්නට ඇතැයි අනුමාන කිරීමට පිළිවන (Indrapala 2005, 323). මෙම මුද්‍රාව හා එහි අන්තර්ගත අභිලේඛනය ක්‍රිːවː 3 හෝ 4 සියවසේ දී මෙරට හා දකුණු ඉන්දියාව අතර වෙළඳ සම්බන්ධතා පැවති බවට සාක්ෂ්‍ය දරයි.

ක්‍රි.ව. 7 හෝ 8 සියවසට අයත් තිරියාය ගිරිලිපියේ විදේශ වෙළඳ කටයුතුවල නිරත වූ 'තුපුස්සක' හා 'වල්ලික' යන අයගේ වෙළඳ ශ්‍රේණි විසින් 'ගිරිකණ්ඩි චෛත්‍යය' ගොඩනැංවූ බව සඳහන් වෙයි (EZ IV 160). මෙම ලිපියේ සමුද්‍රයේ යාත්‍රා කිරීමේ දක්ෂතාව සහිත වෙළඳ ශ්‍රේණි භාණ්ඩ විකිණීමට හා මිල දී ගැනීමට සම්බන්ධ වූ බව හා ඔවුන්ගේ යාත්‍රාවල විවිධ වර්ගයේ භාණ්ඩ පටවා තිබූ බව දක්වා ඇත (EZ IV 159). තිරියාය ඉතා වැදගත් වරායක් වූ ගෝකණ්ණයට ආසන්න ව පිහිටා තිබීම ද මෙහි දී වැදගත් වෙයි.

විදේශ වෙළඳාම හා සම්බන්ධ වෙළඳ භාණ්ඩ පිළිබඳ ව මෙම අවධියට අයත් අභිලේඛනවල තොරතුරු හමුවන අවස්ථා ඉතා විරල ය. චීන සේද රෙදි වෙළඳ භාණ්ඩයක් වූ බව සීගිරි කුරුටු ගීයක 'සිනපට' යනුවෙන් සඳහන්වීමෙන් පැහැදිලි වේ (Paranavitana 1956, NO. 399). අනුරාධපුරයේ කැණීම්වලින් ක්‍රිːවː 10වන සියවසට අයත් චීන



අභිලේඛනයක් සහිත පෝසිලේන් පෙට්ටියක් හමු වී තිබේ (Silva 2000, 60).

ක්‍රි.ව. 9වන සියවසේ දී දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි මුලින් ම මෙරට විදේශ වෙළඳාමට සෘජු ව සම්බන්ධ වූ බව පෙනී යයි. අනුරාධපුරයේ හින්දු නටබුන් ප්‍රදේශයෙන් හමු වූ ශ්‍රී ලංකාවේ මුල් ම දෙමළ ශිලා ලිපියේ (ක්‍රි.ව. 9 සියවස) 'නාණ්කුනාට්ටාර්' නම් දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණියක් විසින් බෞද්ධ විහාරයක් තැනවීම ගැන සඳහන් කර තිබේ (Indrapala 1971, 1; Indrapala 2005, 377). දකුණු ඉන්දීය කණ්ණඩ අභිලේඛනවල මෙය 'නාල්කුනාටු' ලෙස හඳුන්වා දී ඇත. මෙම ශිලාලිපියට අනුව තනවන ලද බෞද්ධ විහාරය 'මාක්කෝතයිප්පල්ළෙ' නම් විය. මේ අනුව මොවුන් කේරළයේ මාක්කෝතෛ ප්‍රදේශයේ සිට අනුරාධපුරයට පැමිණ නගරයේ වෙළඳාම සඳහා වූ කොටසේ පදිංචි වූ දෙමළ බෞද්ධයන් පිරිසක් විය හැකිය (Pathmanathan 2002,51). අනුරාධපුර යුගයේ අවසාන කාලයේ දී හින්දු නටබුන් ප්‍රදේශයේ ද්‍රවිඩ වෙළඳ ප්‍රජාවක් පදිංචි ව සිටි බව පෙනී යයි. මෙම ප්‍රදේශයෙන් හමු වූ දෙමළ ශිලා ලිපියක හමුවන 'කුමාරකණම්' යන්නෙන් වෙළඳ ශ්‍රේණියක් විසින් පාලනය කරන ලද වෙළඳ නගරයක් හඳුන්වා දී ඇති බව පද්මනාදන් විසින් පෙන්වා දී ඇත (Pathmanathan 2002, 50). මෙම ශිලාලිපිවල ප්‍රදානයන් සිදු කළ බව දැක්වෙන 'චන්කන්' හා 'චෙන්නෙ' යන අය 'චෙට්ටි' නමින් හැඳින්වූ වෙළඳුන් වූ බව ඔහු තව දුරටත් ප්‍රකාශ කරයි.

## ක්‍රි.ව. 10 සියවස - ක්‍රි.ව. 15 සියවසේ අවසානය දක්වා

මෙම කාලවකවානුවට අයත් අභිලේඛනවලින් තත්කාලීන විදේශ වෙළඳාම සම්බන්ධ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමට දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි ප්‍රබල ලෙස මැදිහත් වීම, විදේශ වෙළඳ කටයුතු පාලනය කෙරෙහි පාලකයන්ගේ අවධානය හා ඒ සම්බන්ධ නීති සම්පාදනය කිරීම හා මුස්ලිම් වෙළඳුන් විදේශ වෙළඳාම සැලකිය යුතු ප්‍රමාණයකින් සම්බන්ධ වීම මේ අතර ප්‍රධාන වේ.

දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි විසින් පිහිටුවන ලද අභිලේඛන සැලකිය යුතු ප්‍රමාණයක් මෙරටින් හමු වී ඇති අතර වෙනත් අභිලේඛනවල ද ඇතැම් අවස්ථාවල දී මෙම වෙළඳ ශ්‍රේණි පිළිබඳ ව සඳහන් වෙයි. ක්‍රිːවː 10 වන සියවසට අයත් බදුලු ටැම් ලිපියේ 'වණිග්‍රාමන්' යන පදය දැකිය හැකිය (EZ III 75). සමුද්‍ර වෙළඳාම හා බැඳුණු මුල් ම දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණියක් වූ මණිග්‍රාමම් පිළිබඳ ව මෙයින් දැක්වෙන බව පෙන්වා දී තිබේ. මෙකල මෙම වෙළඳ ශ්‍රේණිය හෝපිටිගමුව වෙළඳ මධ්‍යස්ථානයේ වාණිජ කටයුතුවල නිරත වූ බව පෙනී යයි. ක්‍රිːවː 10වන සියවස වනවිට මෙය රට අභ්‍යන්තරයේ වූ

හෝපිටිගමුවෙහි ක්‍රියාත්මක වී නම් ඊට පෙර ප්‍රධාන වරායන්හි වෙළඳ කටයුතු සිදුකළ බව සිතිය හැකිය (Indrapala 2005, 195). මෙම වෙළඳ ශ්‍රේණිය ක්‍රි.ව. 9 හා 10 සියවස්වල දී ප්‍රධාන වශයෙන් කේරළයේ හා තමිල්නාඩුවේ (විශේෂයෙන්ම පුදුකොට්ටායි ප්‍රදේශයේ) වෙළඳ කටයුතු සිදු කළ බව පෙනී යයි (Karashima and Subbarayalu 2002,86).

ක්‍රි.ව. 10වන සියවසේ පමණ සිට ප්‍රබල ව ඉස්මතු වූ දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි අතර අයිඤ්ඤූර්රුවර් (Ainnurrruvar), වීර වලඤ්චියාර් හෝ වලඤ්චියාර්, නානාදේශී හෝ නානාතේචියාර් (ඇතැම් විට අයිඤ්ඤූර්රුවාර් වශයෙන් ද හඳුනාගෙන ඇත), මණිග්‍රාමම් හෝ වණික්ග්‍රාමම් හා නකරත්තාර් ප්‍රධාන වේ (Indrapala 1990, 154). මෙම වෙළඳ ශ්‍රේණි පිළිබඳ ව තොරතුරු හෙළිකරන ප්‍රධාන මූලාශ්‍ර වන ඔවුන් විසින් පිහිටුවන ලද අභිලේඛන 314ක් දකුණු ඉන්දියාව, ශ්‍රී ලංකාව හා අග්නිදිග ආසියාව යන ප්‍රදේශවලින් සොයා ගෙන තිබේ (Karashima 2002, 5). ශ්‍රී ලංකාවේ හමු වී ඇති මෙම අභිලේඛන ප්‍රමාණය සම්බන්ධයෙන් පොදු එකඟතාවක් දක්නට නොලැබේ.

නානාදේශී වෙළඳ ශ්‍රේණිය පිළිබඳ තොරතුරු හෙළිවන ශිලා ලේඛන 20කට නොඅඩු ප්‍රමාණයක් මෙරටින් හමු වී ඇති බව ප්‍රකාශ කරන පද්මනාතන් කළුතර ශිලාලිපිය හැර සෙසු සියලු අභිලේඛන ක්‍රි.ව. 11 හා 12 සියවස්වලට අයත් වන බවත් ලීලාවතී රැජනගේ කාලයට අයත් අනුරාධපුර ශිලාලිපිය හා පොළොන්නරුව අසළ අනවුලුන්දාව ශිලාලිපිය හැර සෙසු ශිලාලේඛන දෙමළ භාෂාවෙන් රචනා කර ඇති බවත් පෙන්වා දෙයි (Pathmanathan 1984, 124). නානාදේශී හෙවත් අයිඤ්ඤූර්රුවාර් වෙළඳ ශ්‍රේණියට අයත් අභිලේඛන 10ක් පමණ දක්නට ලැබෙන බව වැඩිදුරටත් පෙන්වා දී ඇත. මෙරට ක්‍රියාත්මක වූ වඩාත් වැදගත් දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි පිළිබඳ ව සඳහන් වන අභිලේඛන දහතුනක් හමුවී ඇති බව ඉන්ද්‍රපාල විසින් සඳහන් කර තිබේ (Indrapala 1990, 154). ක්‍රි.ව. 11වන සියවසට අයත් එක් ශිලා ලිපියක් ද ක්‍රි.ව. 12වන සියවසට අයත් ශිලා ලිපි 11ක් ද ක්‍රි.ව. 13 වන සියවසට අයත් එක් ශිලා ලිපියක් හා ක්‍රි.ව. 14වන සියවසට අයත් ශිලා ලිපි දෙකක් වශයෙන් ශ්‍රී ලංකාවේ දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි විසින් පිහිටුවන ලද ශිලා ලිපි 15ක් දක්නට ලැබෙන බව කරාෂිමා පවසයි (Karashima 2002, 5).

මෙම අභිලේඛන වාහල්කඩ, පදවිය, විහාරෙහින්න, පොළොන්නරුව, ගල්ටැන්පිටිය, දෙනියමුල්ල, බුදුමුත්තාව, අතරගල්ල, ඉලක්කට්ටු-එබ, අනවුලුන්දාව වැනි ස්ථානවලින් හමුවී ඇත (Veluppillai 1972, 9-11, 13, 16, 19-22, 23-26; Subbarayalu and Karashima 2002, 28-34; Pathmanathan 2002, 62-69; Indrapala 1990, 155). මෙම වෙළඳ ශ්‍රේණි විවිධ වෘත්තිමය කණ්ඩායම් විශාල ප්‍රමාණයක් හා විවිධ වෙළඳ කණ්ඩායම් සමඟ සම්බන්ධව පැවතුණි. අභිලේඛනවල විවිධ වෙළඳ



කණ්ඩායම් පිළිබඳ ව දක්වා ඇති බැවින් ඇතැම් අවස්ථාවල දී අභිලේඛන පිහිටුවන ලද වෙළඳ ශ්‍රේණිය නිවැරදි ව හඳුනාගැනීම දුෂ්කර ය.

මෙම වෙළඳ ශ්‍රේණි අතරින් වඩාත් ප්‍රබල වෙළඳ සංවිධානය වශයෙන් අයිඤ්ඤූර්රුවාර් හඳුනාගැනීමට පිළිවන. 'නානාදේශී' හා 'පදිනෙන්විශයම්' යන පද මෙම ශ්‍රේණිය සඳහා එහි ක්‍රියාකාරකම්වල පෘථුලත්වය දැක්වීමට යෙදූ වචන බව පෙන්වා දී තිබේ (Karashima and Subbarayalu 2002, 86). ශ්‍රී ලංකාවෙන් හමු වූ මෙම වර්ගයේ අභිලේඛන වැඩි ප්‍රමාණයක් මෙම වෙළඳ ශ්‍රේණිය මගින් පිහිටුවන ලද ඒවා ය.

නානාදේශී වෙළඳ ශ්‍රේණියට අයත් සෙන්ටිමීටර 4.5ක ප්‍රමාණයේ ලෝකඩ මුද්‍රාවක් රිදීයගමින් සොයා ගෙන ඇත. මෙහි 'නානාදෙසින් සකයි' (Nānādesin Sakai) යන පාඨය ද දුර්ගා දෙවඟනගේ රූපයක් හා පූජනීය කන්දක රූපයක් ද දක්නට ලැබේ (Pathmanathan 1984, 126; Bopearachchi and Wickremasinghe 1999). මෙම මුද්‍රාව වෙළඳ ශ්‍රේණිය විසින් වෙළඳ භාණ්ඩ මුද්‍රා තැබීම සඳහා භාවිත කරන ලදැයි අනුමාන කිරීමට පිළිවන. පදවියෙන් හා ජේතවනාරාමයෙන් හමු වූ කුඩා ලෝකඩ හින්දු දේව ප්‍රතිමා දෙකක පාදස්තලයේ 'නානාදේසි' යන්න සටහන් කර තිබුණි. මෙම ප්‍රතිමා උක්ත වෙළඳ ශ්‍රේණියේ සාමාජිකයන් විසින් පූජා කරන ලද බව පැහැදිලි වේ. ක්‍රි.ව. 1970 දී පදවියෙන් 'ශ්‍රීපතිග්‍රාම' යන පාඨය ග්‍රන්ථාක්ෂරවලින් දක්වා ඇති මුද්‍රාවක් සොයාගන්නා ලදී (Indrapala 2005). මෙය බොහෝ දුරට විදේශ වෙළඳාම හා සම්බන්ධ මුද්‍රාවක් බව අනුමාන කළ හැකිය. නානාදේශී වෙළඳ ශ්‍රේණියේ අභිලේඛනවල ව්‍යාප්තිය අනුව ඔවුන් අනුරාධපුරය, පොළොන්නරුව වැනි ප්‍රධාන නගරවල හා උතුරු ප්‍රදේශයේ මෙන් ම ශ්‍රී ලංකාවේ බටහිර ප්‍රදේශයේ හා දකුණු ප්‍රදේශයේ ද ප්‍රබල ලෙස ක්‍රියාත්මක වූ බව පැහැදිලි වේ.

වාහල්කඩ ප්‍රදේශයෙන් හමුවූ දීර්ඝ ශිලාලිපියක හා ශේෂ වූ ශිලාලිපියක කොටසක දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි ගැන සඳහන් කර තිබේ. දීර්ඝ ලිපිය 'තිචයිආයිරත්තු අයිඤ්ඤූර්රුවාර්' යනුවෙන් හඳුන්වා ඇති වෙළඳ ශ්‍රේණිය විසින් පිහිටුවන ලද්දකි (Veluppillai 1972, 7). ශේෂ වූ ශිලා ලිපි කොටසට අනුව එම ලිපිය කරවූ 'වීරකොටි' නම් වෙළඳ ශ්‍රේණිය විසින් 'වීරපට්ටිනම්' නම් නගරයක් අරඹා එහි සීමා දැක්වීම සඳහා ගල් පුවරු පිහිටුවා ඇත (Veluppillai 1972, 8). ශ්‍රී ලංකාවේ වෙළඳ ශ්‍රේණි සමඟ සම්බන්ධ නගර ('නකරම්') මොවුන් විසින් පිහිටුවන ලද ඒවා ය. වීරකොටි වෙළඳ ශ්‍රේණි සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූ හමුදා සමාජයකි (Pathmanathan 2002, 69). වාහල්කඩ ලිපියක මාන්තායිහි බෝට්ටුකරුවන්ගේ ශ්‍රේණියේ ප්‍රධානියා පිළිබඳ ව ද සඳහන් වෙයි.

'තිචයි ආයිරත්තු අයිඤ්ඤූර්රුවාර්' වෙළඳ ශ්‍රේණියේ ශිලාලිපි දෙකක් පදවිය ප්‍රදේශයෙන් හමු වී තිබේ (Veluppillai 1972, 25).

ඇතැම් විට ඔවුන් විසින් පදවියේ ශිව දේවාල තනවන්නට ඇතැයි අනුමාන කිරීමට පිළිවන. මෑතක් වනතුරු ම දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ දේවාල තැනීම හා පවත්වාගෙන යාම 'චෙට්ටි' නම් වෙළඳුන් විසින් සිදු කර ඇත. ක්‍රි.ව. 12 හෝ ක්‍රි.ව. 13 සියවසට අයත් පදවිය ශිලාලිපියක වෙළඳ සමාගමක් විසින් ශිව දේවාලයකට සිදුකළ ප්‍රදානයන් පිළිබඳ ව තොරතුරු දක්වේ (Veluppillai 1972, 19). මෙම ලිපියට අනුව 'අයිඤ්ඤූර්රුවාර්' වෙළඳ ශ්‍රේණියේ මූලස්ථානය ඉන්දියාවේ අයිහොලේ ප්‍රදේශයේ පිහිටා තිබූ බව පෙනී යයි.

ක්‍රි.ව. 12 වන සියවසේ පළමු භාගයට අයත් විහාරහින්න ශිලාලිපියේ අරමුණ වී ඇත්තේ 'මාසේන-ගාමම්' නම් වෙළඳ ජනාවාසයකට විරුදනාමයක් ලබාදීම හා එම ජනාවාසයේ මුදල් එකතු කිරීම් සම්බන්ධ කොන්දේසි වාර්තා කිරීමයි (Subbarayalu and Karashima 2002, 28). මෙම ශිලාලිපියේ පහනක්, ත්‍රිපාදයක් මත ඇති හක් ගෙඩියක් හා එය මත රෝදයක් හෝ සූර්ය සංකේතයක් වැනි සංකේත දක්නට ලැබේ. මේවා අදාළ වෙළඳ ශ්‍රේණියේ සුභ සංකේත බව අනුමාන කිරීමට පිළිවන.

බුදුමුත්තාව ශිලාලිපිය අයිඤ්ඤූර්රුවාර් වෙළඳ ශ්‍රේණිය විසින් පිහිටුවන ලද්දකි. මෙම ශිලා ලිපියේ මාගල නිකවැරටිය ප්‍රදේශයේ පිහිටා තිබූ වෙළඳ නගරයක් පිළිබඳ ව සඳහන් වෙයි (Pathmanathan 2002, 62). මාගල ප්‍රදේශයේ පරමේශ්වරී නම් මව් දෙවඟනට කැපකළ දේවාලයක් පැවති බව මෙමගින් අනාවරණය කර ගත හැකිය. ඇය 'නානාදේශී' වෙළඳුන්ට රැකවරණය දෙන ඔවුන්ගේ භාරකාර දේවතාවිය ලෙස සලකා තිබීම වැදගත් කරුණකි (Pathmanathan 2002, 66). 'අයිඤූර්රුවන්පල්ළි' යන්නෙන් අදාළ වෙළඳ ශ්‍රේණිය විසින් පිහිටුවන ලද හෝ ප්‍රතිසංස්කරණය කරන ලද බෞද්ධ විහාරයක් ගැන සඳහන් කර ඇති බව පැහැදිලි වේ.

පොළොන්නරුවේ ශිව දේවාලයකින් හමු වී ඇති ක්‍රි.ව. 11වන සියවසට අයත් ශිලාලිපියක පොළොන්නරුවේ කොටසක් ලෙස සැලකිය හැකි 'වීර පට්ටනම්' නම් ස්ථානයේ පිහිටා තිබූ නානාදේශී වෙළඳ ශ්‍රේණියට අයත් විහාරයක් පිළිබඳ ව දක්වා ඇත (Veluppillai 1972, 9-11). ක්‍රි.ව. 13 සියවසට අයත් ගලටැන්පිටිය ශිලා ලිපියේ 'වීරකොටි' නම් වෙළඳ කණ්ඩායමක් ගැන සඳහන් වෙයි. මෙය ග්‍රන්ථාක්ෂර හා දෙමළ අක්ෂරවලින් රචනා කරන ලද්දකි (Veluppillai 1972,13). දෙනියමුල්ල ශිලාලිපියේ හමුවන 'නානාතේචි' හා 'චෙට්ටි' යන පද අනුව එය දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි හා සම්බන්ධ අභිලේඛනයක් බව පැහැදිලි ය (Veluppillai 1972, 13). ලීලාවතී රැජනගේ රාජ්‍ය කාලයට අයත් අනුරාධපුර ශිලාලිපියෙන් නානාදේශී වෙළඳ ශ්‍රේණියේ තීරු බදු අය කළ ස්ථානයක් ගැන අනාවරණය වෙයි (EZ I 177-182).



නානාදේශිකන්ට අමතර ව ඔවුන්ට සමකාලීන ව මෙරට වෙළඳ කටයුතු සිදුකළ තවත් විදේශීය වෙළඳ ශ්‍රේණි පැවතුණි. 'අඤ්ජුවණ්ණම්' (Añjuvannam) නම් වෙළඳ ශ්‍රේණියේ සාමාජිකයෙක් ශ්‍රී ලංකාවේ මාන්තෝට්ටමේ (මාතෝට්ටම්) සිට පැමිණ දකුණු ඉන්දියාවේ විශාකපට්ටනම්හි පූජනීය ස්ථානයක් (මුස්ලිම් පල්ලියක්?) තැනවීම හෝ එයට ප්‍රදානයන් සිදුකිරීම ගැන එම ස්ථානයෙන් හමු වූ ශිලාලිපි තුනක සඳහන් වේ (Karashima and Subbarayalu 2002, 185). මෙය ක්‍රිස්තියානීන්, යුදෙව්වන් හා මුස්ලිම්වරුන්ගෙන් සමන්විත වූ විදේශ වෙළඳ ශ්‍රේණියක් බව විශ්වාස කරනු ලැබේ. ක්‍රි.ව. 14වන සියවසට අයත් ලංකාතිලක දෙමළ ශිලාලිපියේ 'පතිනෙණ්විෂයියම්' යනුවෙන් හඳුන්වා ඇත්තේ මධ්‍ය කාලීන දකුණු ඉන්දියාවේ ප්‍රධාන සංක්‍රමණික වෙළඳ කණ්ඩායමකි (Pathmanathan 2002, 39). ඔවුන් විසින් ලංකාතිලක විහාරයට ප්‍රදානයන් සිදුකර ඇත. අභ්‍යන්තර වෙළඳුන් සමඟ මෙම වෙළඳ කණ්ඩායම සම්බන්ධතා පැවැත්වූ බවත් රට අභ්‍යන්තරයේ පිහිටි මධ්‍යම කඳුකර ප්‍රදේශයට ඔවුන්ගේ වෙළඳ ක්‍රියාකාරකම් ව්‍යාප්ත ව පැවති බවත් විශ්වාස කළ හැකිය. ක්‍රි.ව. 12 හා 13 සියවස්වල දී පාණ්ඩ්‍ය හා කොන්ගු ප්‍රදේශවල වෙළඳාමට ප්‍රබල ව මැදිහත් වූ මොවුන් විසින් නාගපට්ටනම්හි විහාරයකට ද අනුග්‍රහ දක්වන ලදි.

ක්‍රි.ව. 1000-1300 අවධියේ විදේශ වෙළඳාම හා බැඳුණු වැදගත් ලක්ෂණයක් ලෙස 'නගරම්' නම් වෙළඳ මධ්‍යස්ථානවල වර්ධනය හඳුනාගැනීමට පිළිවන. මේවා පිහිටුවීම හා කළමනාකරණය සිදුකර ඇත්තේ නානාදේශී වෙළඳ ශ්‍රේණිය විසිනි (Pathmanathan 1984, 122). මෙවැනි වෙළඳ නගර පදවිය, වාහල්කඩ, විහාරෙහින්න, මාගල (නිකවැරටිය) යන ප්‍රදේශවල පිහිටා තිබූ බව අභිලේඛනවලින් සනාථ වෙයි. වාහල්කඩ ශිලාලිපි සාධක අනුව එහි පිහිටා තිබූ වෙළඳ නගරය 'වීරපට්ටිනම්' නම් වූ අතර ගල් පුවරු මගින් එහි සීමා දක්වා තිබුණි (Veluppillai 1972, 8). 'වික්කිරමඡාලාමේකපුරම්' නමින් හැඳින්වූ වෙළඳ නගරය නිකවැරටියේ මාගල ප්‍රදේශයේ පිහිටා තිබූ බව බුදුමුත්තාව ශිලාලිපියෙන් අනාවරණය වේ (Pathmanathan 2002, 62). පදවියේ පිහිටා තිබූ වෙළඳ නගරය 'අය්යම්පොලිල් පට්ටිනම්' නමින් හඳුන්වා ඇත.

ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සම්බන්ධ ඉතා වැදගත් කාර්යභාරයක් 'නගරම්' මගින් සිදුකර තිබේ. ඒවායේ මනා පරිපාලනයක් පැවති බවට සාධක හමුවේ. විදේශ වෙළඳාම සම්බන්ධ වෙළඳ භාණ්ඩ එකතු කිරීම හා බෙදා හැරීම මෙම වෙළඳ මධ්‍යස්ථාන මගින් සිදු කර ඇත. මාගල ප්‍රදේශයේ පිහිටා තිබූ වෙළඳ නගරය සංක්‍රමණික වෙළඳාමේ මධ්‍යස්ථානයක් බවට පත්වී තිබුණි (Pathmanathan 2002, 64). පදවිය ශිලාලිපියේ නගරයෙන් අය කළ බදු

ගැන සඳහන් වෙයි (Veluppillai 1972, 22). මෙම වෙළඳ නගරවල බදු එකතු කිරීමේ අයිතිය ද වෙළඳ ශ්‍රේණි සතු විය. ඒවායේ පාලනය සම්බන්ධයෙන් සම්මුතියක් පැවති අතර එම සම්මුතිය කඩකළ පුද්ගලයන්ට ලබාදිය යුතු දඬුවම් නියම කර තිබූ බව ඇතැම් අභිලේඛනවලින් හෙළිදරව් කර ගැනීමට පිළිවන. විහාරෙහින්න ශිලාලිපියට අනුව ලිපිය පිහිට වූ නානාදේශී ශ්‍රේණිය, නාට්ටු - චෙට්ටි හා ඔවුන් සමඟ සම්බන්ධ නමින් නොදැක්වූ වෙනත් වෙළඳ කණ්ඩායම්වලට එම නගරයේ මුදලින් බදු එකතු කිරීමේ අයිතිය පැවරී තිබුණි (Subbarayalu and Karashima 2002, 34).

වාහල්කඩ ශිලාලිපියට අනුව වීරපට්ටනම්හි වෙළඳසල්වලින් බදු එකතු කිරීම සිදු කර ඇති බවත් එහි මාර්ග මනා ව නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් පැවති බවත් පෙනී යයි. පදවිය නානාදේශී ශිලා ලිපියේ තවලම් ගැන සඳහන් වේ. මේවා නගරම්වල පාලනය යටතේ පවතින්නට ඇත. I රාජේන්ද්‍ර රජුගේ කාලයට අයත් අතරගල්ල ශිලා ලිපියේ 'අඤ්ඤූර්රුවන් අම්බලම්' යන පදය දක්නට ලැබේ. මේවා එම වෙළඳ ශ්‍රේණියේ වෙළඳ භාණ්ඩ ප්‍රවාහනයේ දී අතර මග දී වෙළඳුන්ට විවේක ගැනීමට හා නවාතැන් ගැනීමට තැනූ අම්බලම් බව අනුමාන කිරීමට පිළිවන (Pathmanathan 1984, 150, 151).

ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමට සම්බන්ධ වූ දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි වෙළඳ කටයුතු සිදුකළ ප්‍රදේශ පිළිබඳ ව අභිලේඛනවලින් අනාවරණය වෙයි. ඔවුන් තමිල්නාඩුව, සිංහල දේශය ('චින්කළම්'), චීනය ('චීනම්'), අරාබිය ('කෝණකම්'), 'වාචකම්' හා 'කටාරම්' (මැලේසියාවේ හා ඉන්දුනීසියාවේ ප්‍රදේශ?) යන ප්‍රදේශවල වෙළඳ කටයුතුවල නිරත වූ බව අභිලේඛනවල දක්වා ඇත (Veluppillai 1972, 11). ඉන්දියාවේ කර්ණාටක, ආන්ද්‍රා, කේරළ, මහාරාෂ්ට්‍ර, තමිල්නාඩු යන ප්‍රාන්තවලින් මෙම වෙළඳ ශ්‍රේණිවලට අයත් අභිලේඛන විශාල ප්‍රමාණයක් හමු වී තිබේ (Karashima 2002, 5). බුරුමයේ පගාන් (ක්‍රි.ව. 12 සියවස) හා ඉන්දුනීසියාවේ සුමාත්‍රා දූපතේ 'Loboe - Toewa' (ක්‍රි.ව. 1078) යන ස්ථානවලින් ද මෙම වෙළඳ ශ්‍රේණිවලට අයත් අභිලේඛන සොයාගත හැකි විය (Pathmanathan 1984, 123). මේ අනුව දකුණු ආසියාවේ හා අග්නිදිග ආසියාවේ විදේශ වෙළඳාමේ එක්තරා ප්‍රමාණයක ඒකාධිකාරයක් දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි සතු ව පැවති බව විශ්වාස කිරීමට පිළිවන. වෙනත් ප්‍රදේශ සමඟ ද ඔවුන් වෙළඳ සම්බන්ධ පැවැත් වූ බවට සැකයක් නොමැත.

අයිඤ්ඤූර්රුවාර් වෙළඳ ශ්‍රේණිය විවිධ වෙළඳ කණ්ඩායම්, වෘත්තිකයන් කලා ශිල්පීන් හා හමුදා ඒකකවලින් ද සමන්විත වූ සංවිධානයකි (Karashima and Subbarayalu 2002, 76-84). ශ්‍රී ලංකාවේ වෙළඳුන් ද එයට සම්බන්ධ වී සිටි බවට සාධක හමුවේ. දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි අභිලේඛනවල 'තෙණ්ණිලන්ගයි වළඤ්ජියාර්' යන



පදයෙන් ශ්‍රී ලංකාවේ වෙළඳුන් පිළිබඳ ව සඳහන් කර ඇති අතර 'කරුණාකර - වීරර්' යනුවෙන් දක්වා ඇත්තේ ද මෙරට වෙළඳ කණ්ඩායමක් බව පෙනී යයි. වීරවළඤ්චියාර්, චෙට්ටි, වණිය වැනි වෙළඳ කොටස් නානාදේශී සංවිධානය සමග සම්බන්ධ ව නගරම්වල ද දේශීය හා ප්‍රාදේශීය වශයෙන් වෙළඳ කටයුතු සිදුකර ඇත (Pathmanathan 1984, 147). විහාරෙහින්න ශිලාලිපියේ චෙට්ටි, පණිවිඩකරුවන්, සෙබළුන් වැනි කොටස් ගැන තොරතුරු දැක්වේ. 'වීරර්' හෝ 'වීර-කොඩියාර්' වශයෙන් හඳුන්වා ඇත්තේ වෙළඳ ශ්‍රේණිය සම්බන්ධ සෙබළුන්ය (Subbarayalu and Karashima 2002, 30). විහාරෙහින්න ශිලාලිපියේ දක්වා ඇති කඩුව, දවුල, කිරිච්චිය යන මෙවලම්වලින් සමහරක් ඔවුන්ගේ ආයුධ විය හැකි බව වැඩි දුරටත් පෙන්වා දී තිබේ. වෙළඳ භාණ්ඩ ප්‍රවාහනයේ දී, ගබඩා කර තැබීමේ දී මෙන් ම වෙළඳාම් කිරීමේ දී ඒවාට ආරක්ෂාව සැපයීම හා වෙළඳුන්ට ආරක්ෂාව සැපයීම ඔවුන්ගේ කාර්යය වූ බව පෙනී යයි.

ඉහළ අගයක් සහිත වෙළඳ භාණ්ඩ වෙළඳ කටයුතුවල දී වැදගත් වීම වෙළඳ ශ්‍රේණි විසින් ආරක්ෂාව සඳහා හමුදා කණ්ඩායම් යොදා ගැනීමට හේතු වූ සාධකයක් බව විශ්වාස කළ හැකිය. මෙකල විදේශ වෙළඳාමේ දී වැදගත් වූ භාණ්ඩ පිළිබඳ ව ශ්‍රී ලංකාවේ අභිලේඛනවලින් තොරතුරු ස්වල්පයක් පමණක් අනාවරණය වුව ද දකුණු ඉන්දීය අභිලේඛනවලින් ඒ පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වෙයි. ඇතුන් හා අශ්වයන් මෙරටට ගෙන්වූ බව I පරාක්‍රමබාහු රජුගේ නයිනතිව් දෙමළ ශිලාලිපියේ සඳහන් වේ (Indrapala 1963, 67-70). විහාරෙහින්න ශිලාලිපියේ නානාදේශී වෙළඳ ශ්‍රේණියට සම්බන්ධ වූ බුලත් වෙළඳුන් ගැන දක්වා ඇත (Subbarayalu and Karashima 2002, 28). අලි, ඇතුන්, අශ්වයන්, මුතු, මැණික්, දියමන්ති, ඔනික්ස්, ලැපිස්ලැසුලි, සඳුන්, සුවඳ විලවුන්, කපුරු, කස්තුරි, කහ විදේශ වෙළඳාමේ දී වැදගත් වූ වෙළඳ භාණ්ඩ අතර ප්‍රධාන විය (Pathmanathan 194, 123). ක්‍රි:ව: 1345ට අයත් වෙමාගේ මදුරාසි කෞතුකාගාර අභිලේඛනයේ තෙළිඟු රටට විවිධ ප්‍රදේශවලින් ගෙන ආ විදේශීය භාණ්ඩ ගැන සඳහන් වේ. ඒ අතර ශ්‍රී ලංකාවෙන් අලි ගෙන්වූ බව වාර්තා කර ඇත (Ramayya 1981, 12).

මෙම කාලවකවානුවේ දී මෙරට වෙළඳුන් විදේශ රටවලට වෙළඳ කටයුතු සඳහා ගමන් කළ බවට වෙනත් මූලාශ්‍රයන්හි තොරතුරු සඳහන් වුව ද ඒ සම්බන්ධ අභිලේඛනමය සාධක ඉතා විරලය. ජාවක එයර්ලංග්ග රජුගේ (ක්‍රි.ව. 1019-1042) රාජ්‍යයට අයත් වරායන්ට සිංහල වෙළඳුන් පැමිණි බව එම රජුගේ අභිලේඛනවල සඳහන් වේ (රණවැල්ල 1984, 284).

විදේශ වෙළඳ කටයුතු පාලනය කිරීම සඳහා මෙරට පාලකයන්ගේ අවධානය යොමු වූ බව අභිලේඛනවලින් අනාවරණය කරගත හැකිය. I පරාක්‍රමබාහු රජුගේ නයිනතිව් දෙමළ ශිලා ලේඛනය, II පරාක්‍රමබාහු

රජුගේ දෙවුන්දර ශිලා ලිපිය හා IVවන බුවනෙකබාහු රජුගේ කාලයට අයත් ලංකාතිලක ශිලා ලිපි දෙකක් මේ සම්බන්ධයෙන් වැදගත් වන බව පෙනී යයි. නයිනතිව් ශිලාලිපියට අනුව රජු සඳහා ඇතුන් හෝ අශ්වයන් ගෙන එන නැව් මුහුදුබත් වුවහොත් හතරෙන් කොටසක් භාණ්ඩාගාරයට ගත යුතුය. අනෙක් කොටස් තුන අයිතිකරු සඳහා ඉතිරි කළ යුතුය. වෙළඳ නැව් මුහුදුබත් වුවහොත් දෙකෙන් කොටසක් භාණ්ඩාගාරයට ගත යුතු අතර ඉතිරිය අයිතිකරු සඳහා ඉතිරි කළ යුතුය (Indrapala 1963,63-70). මෙම ශිලාලිපිය දෙමළ භාෂාවෙන් රචනා කරන ලද්දේ මෙකල ඉන්දීය සාගරයේ වෙළඳ කටයුතුවල නිරත වූ වෙළඳුන් භාවිත කළ ප්‍රධාන භාෂාව වීම නිසා බව පැහැදිලි වේ. අභිලේඛනය හමු වූ ප්‍රදේශයට නුදුරින් මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ වැදගත් වරායක් වූ ඌරාතොට (කයිට්ස්) පිහිට තිබීම ද වැදගත් කරුණකි.

II පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1236-1270) දෙවුන්දර ශිලාලිපිය එහි පිහිටා තිබූ වෙළඳ වරායේ පරිපාලනය සම්බන්ධ ව්‍යවස්ථාවක් වශයෙන් හැඳින්විය හැකිය (Paranavithana 1953, 63-70). මෙම ශිලාලිපියට අනුව දෙවුන්දර වෙළඳ වරායේ පාලනය 'මහා පණ්ඩිත' නම් නිලධාරියෙකු යටතේ පැවතුණි. රජයට තීරු බදු ගෙවීමෙන් වැළකී සිටීම සඳහා වෙළඳුන් විසින් යොදනු ලබන ප්‍රයෝග නැවැත්වීමට පියවර ගතයුතු බව සඳහන් වෙයි. මෙම ලිපියට අනුව විදේශයන්හි සිට පැමිණෙන වෙළඳුන් විසින් ගෙවිය යුතු සුගම් හෙවත් තීරු බදු නොගෙවා සිටීමට අවකාශ නොදිය යුතුය. වරායේ වෙළඳසල් පිහිටුවීමෙන් ද තෑගි දීමෙන් නිලධාරීන් දූෂණ ක්‍රියාවලට පොළඹවා ගැනීමෙන් ද වැළකී සිටිය යුතු බව දක්වේ. මෙම අභිලේඛනය පිහිටුවීම වරායේ විදේශ වෙළඳ කටයුතු මගින් රජයට බදු වශයෙන් ලැබිය යුතු ආදායම නිසියාකාර ව ලබා ගැනීමට දැරූ ප්‍රයත්නයක් බව පෙනී යයි.

ක්‍රි.ව. 14වන සියවසේ IV බුවනෙකබාහු රජුගේ කාලයට අයත් ලංකාතිලක ශිලා ලිපියේ එන

"ඇතුළු මඩිසයෙන් පිට මඩිසයෙන් නව තොටින් අටලොස් දෙසයෙන් ආ වපාරයන්ගෙන් ගන්න දෙන යම් බඩුයෙකින් සියයට කාලක් නියායෙන් තම්බපත ලියා දුන් සමය ශ්‍රීයෙන්......"

යන පාඨය (Paranavithana 1960, 8, 9) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ ව හැදෑරීමේ දී ඉතා වැදගත් වේ. මෙරට වෙළඳාමේ දී වරායන්හි දී අය කළ තීරු බදු ප්‍රමාණය නිශ්චිත ව දක්වා ඇති එක ම අවස්ථාව වශයෙන් මෙය හඳුනා ගත හැකිය. භාණ්ඩ ආනයනයේ දී මෙන් ම අපනයනයේ දී ද වටිනාකමින් 25%ක් තීරු බදු වශයෙන් අය කර තිබේ. තීරු බදු අය කළ ස්ථාන 'මඩිසය' යනුවෙන් හඳුන්වා ඇත. ආනයන හා අපනයන භාණ්ඩවලින් තීරු බදු අය කරගැනීම සඳහා ඇතුළු මඩිසය හා පිට මඩිසය යනුවෙන් ආයතන දෙකක් පැවති බව පැහැදිලි වේ. මෙරටට වරායන් නවයක් ඔස්සේ රටවල් දහ අටකින්



වෙළඳුන් පැමිණි බව සඳහන් කර ඇත. අය කරන තීරු බදු ප්‍රමාණය තීරණය කිරීම රාජ්‍ය පාලන අධිකාරිය විසින් සිදුකර තිබෙන බවට මෙම ලිපිය සාක්ෂ්‍ය දරයි. ලංකාතිලක දෙමළ ශිලා ලිපියේ ද ඉහත කරුණු වාර්තා ගත කර තිබේ (Pathmanathan 2002, 37).

ක්‍රි.ව. 10 සියවසත් ක්‍රි.ව. 15 සියවසේ අවසානයත් අතර කාලවකවානුවේ දී මුස්ලිම් වෙළඳුන් ද මෙරට විදේශ වෙළඳ කටයුතුවලට සම්බන්ධ වූ බව උක්ත කාලවකවානුවට අයත් අරාබි සෙල්ලිපිවලින් සනාථ වේ. මෙම අවධියට අයත් අරාබි අභිලේඛන විසිහයක් පමණ සොයා ගෙන ඇත (Shukri 1990, 199). මුස්ලිම් ජාතිකයන් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූයේ ද වෙළඳුන් වශයෙනි. ක්‍රි.ව. 8-15 සියවස් අතර බැග්ඩෑඩ්, ඇලෙක්සැන්ඩ්‍රියා, උතුරු අප්‍රිකාව හා උතුරු ඉන්දියාව යන ප්‍රදේශවල පැවති සෑම මුස්ලිම් රාජවංශයකට ම අයත් රන් හා රිදී කාසි ශ්‍රී ලංකාවෙන් හමු වී තිබීම ද ඉතා වැදගත් කරුණකි (Bopearachchi 2001, 107).

අරාබි අභිලේඛන ගාල්ල, බේරුවල, කොළඹ, පොම්පරිප්පු මන්නාරම හා ත්‍රිකුණාමලය වැනි වෙරළබඩ ප්‍රදේශවලින් මෙන් ම පුත්තලම - අනුරාධපුර මාර්ගය, කුරුණෑගල - පුත්තලම මාර්ගය, බලන්ගොඩ හා ශ්‍රී පාද කන්ද වැනි රට අභ්‍යන්තරයේ පිහිටි ප්‍රදේශවලින් ද හමු වී තිබේ (Shukri 1990, 199). මෙම අභිලේඛනවලින් වැඩි ප්‍රමාණයක් සොහොන්ගල් අභිලේඛන වේ. එබැවින් ඒවායින් අනාවරණය වන ඓතිහාසික තොරතුරු ඉතා අල්ප ය. සොහොන් ගල් අභිලේඛන දකුණු ආසියානු කලාපයේ අරාබි - මුස්ලිම් නාවික හා වෙළඳ කටයුතු පිළිබඳ සාධක වශයෙන් හඳුනාගැනීමට පිළිවන. කොළඹ අරාබි සොහොන් ගල් ශිලාලිපියට සමාන සොහොන්ගල් අභිලේඛන ගුජරාටය, චීනය හා නැගෙනහිර අප්‍රිකාව යන ප්‍රදේශවලින් සොයාගෙන ඇත (Shukri 1990, 204). ක්‍රි.ව. 10වන සියවසට අයත් මේවා බැග්ඩෑඩ් නගරයේ දී නිර්මාණය කර මෙරටට ගෙන එන ලදැයි සිතිය හැකිය. ත්‍රිකුණාමලයෙන් හමු වූ අරාබි සොහොන්ගල් අභිලේඛනයක එය අයත් පුද්ගලයා හලබ් හෙවත් අලෙප්පො (Aleppo) ප්‍රදේශයෙන් පැවත එන්නකු බව සඳහන් වේ. මෙම නගරය වර්තමානයේ සිරියාවේ පිහිටා ඇත. මේ අනුව මෙරට ඇතැම් මුස්ලිම්වරුන් බොහෝ විට වෙළඳ කටයුතු සඳහා එම ප්‍රදේශයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පදිංචි වූ බව අනුමාන කිරීමට පිළිවන.

ගාල්ල ත්‍රි භාෂා ශිලාලිපිය ක්‍රි.ව. 1403 දී යින්ග් ලෝ (Ying Lo) චීන අධිරාජ්‍යයාගේ චෙන්-හෝ සේනාපතිවරයා විසින් පිහිටුවන ලද්දකි. මෙය චීන, දෙමළ හා පර්සියානු යන භාෂාවලින් ලියා තිබේ (EZ III 338-340). මෙම භාෂා තුන ප්‍රත්‍යක්ෂ ව ම එම අවධියේ දී කලාපීය වශයෙන් භාවිත වූ වෙළඳාම සම්බන්ධ ප්‍රධාන භාෂා වූ බව පෙනී යයි. ක්‍රි.ව. 15වන සියවස ඉන්දියානු සාගර ප්‍රදේශයේ සාමකාමී විදේශ

වෙළඳාමක් පැවති සමුද්‍ර වෙළඳාමේ ප්‍රතිලාභ විවිධ ජන කණ්ඩායම් අතර බෙදී පැවතුණු කාලයක් බව ප්‍රකාශ කරන සුක්රි විසින් ගාල්ල ත්‍රිභාෂා ලිපිය භාෂා තුනකින් ලියා තිබීම ඒ සඳහා සාධකයක් වශයෙන් පෙන්වා දෙන ලදි. (Shukri 1990, 206). මෙම කාලයේ දී ඉන්දියානු සාගරයේ සමුද්‍ර වෙළඳාම ප්‍රධාන වශයෙන් චීන, දෙමළ හා පර්සියානු ජාතිකයින්ගේ මැදිහත්වීම යටතේ සිදු වූ බව පෙනී යයි. ත්‍රි භාෂා ශිලා ලිපියේ පර්සියානු භාෂාවෙන් ලියූ කොටස සඳහා අරාබි අක්ෂර භාවිත කර තිබේ. මෙයට හේතුව සමුද්‍ර වෙළඳ කටයුතුවලට අරාබි-මුස්ලිම් වෙළඳුන් ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී සිටීම බව විශ්වාස කිරීමට පිළිවන.

ක්‍රි.ව. 16වන සියවසේ සිට ඉන්දියානු සාගරයේ විදේශ වෙළඳ කටයුතු පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන යුරෝපීය ජාතීන්ගේ ග්‍රහණයට නතුවීමත් සමඟ අභිලේඛනවල විදේශ වෙළඳාම පිළිබඳ තොරතුරු හමු නොවන බව පෙනී යයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


(1) පෙරේරා, බී.ජේ. 1960. පුරාණ ශ්‍රී ලංකාව හා විදේශයන් අතර වූ වෙළඳාම. **පුරාණ යුගය - I කාණ්ඩය.** සපරමාදු, එස්. ඩී. (සංස්.), දෙහිවල; තිසර ප්‍රකාශකයෝ.

(2) බෝපෙආරච්චි, ඔස්මන්ඩ්. 1997. ශ්‍රී ලංකාවේ පුරාණ කාසි. **ආර්ථික විමසුම - 23 වෙළුම.** පුංචිහේවා, ජේ. ආර්. (සංස්.), කොළඹ; ප්‍රකාශන අංශය - මහජන බැංකුව.

(3) රණවැල්ල, සිරිමල්. 1984 පුරාතන අර්ථ ක්‍රමය. **මහවැලි වංශය - I කාණ්ඩය.** ඒකනායක, ඩී.එම්.ජී. (සංස්.) මහවැලි සංවර්ධන අමාත්‍යාංශය.

(4) සෝමදේව, රාජ්. 1997 මුල්කාලීන ශ්‍රී ලංකාවේ ආර්ථිකය (අභිලේඛනාත්මක සමීක්ෂණයක්) **ආර්ථික විමසුම - 23 වෙළුම.** පුංචිහේවා, ජේ.ආර්. (සංස්.). කොළඹ ප්‍රකාශන අංශය - මහජන බැංකුව.

(5) සෝමදේව, රාජ්. 1998. අනෛයිකෝඩ්ඩායි ලෝහ මුද්‍රාවː ස්වරාජ්‍යවාදී ප්‍රවේශයෙන් ඔබ්බට. **සරසවිː නිදහස් සමරු ස්වර්ණ ජයන්ති සංග්‍රහය.** ගුණවර්ධන, ප්‍රියශාන්ත, එම්. එම්. ගුණතිලක, අජිත් දිසානායක, ඩී.ජී. කුමාරතුංග. (සංස්.). කඩවත; අභය මුද්‍රණ ශිල්පියෝ.

(6) Bandaranayake, Senake. 1990. Introductory note. **Sri Lanka and the silk road of the sea**. Bandaranayake, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(7) Bopearachchi, Osmund. 1997. Foreword. **Taprobane**. Weerakkody, D.P.M., Brepols Turnhout.





(8) Bopearachchi, Osmund. 2001. Ancient Sri Lanka : new archaeology data of the trade between Rome and China. **Men and monuments**. Prematilleke, L. (ed.). Colombo ; Central cultural fund .

(9) Bopearachchi, Osmund and Rajah Wickremesinhe. 1999. **Ruhuna ancient Civilisation re - visited**. Published by Rajah Wickremesinhe.

(10) Childe, Gordon V. 1979. The urban revolution. **Ancient Cities of the Indus**. Possehl, Gregory L. (ed.) New Delhi ; Vikas Publishing house Pvt. Ltd.

(11) Coningham, R. A. E. , F.R. Allchin, C.M. batt, D. Lucy. 1996. Passage to India? Anuradhapura and the early use of the Brahmi Script. **Cambridge Archeological journal 6:1**. Cambridge University.

(12) Deraniyagala, S. U. 1992. Radiometric Dating of early Brahmi Script in Sri Lanka: 600 - 500 BC. **The prehistory of Sri Lanka part II**. Colombo ; Department of Archaelogical Survey.

(13) Dringer, David. 1968. **The alphabet**. London; Hutchison.

(14) Fernando, Martha Prickett. 1990. Durable goods : The Archaeological evidence of Sri Lanka's role in the Indian ocean trade. Sri Lanka and the silk road of the sea. Bandaranayake, Senake and others (eds.). Central cultural fund.

(15) Gunawardena, R.A. L. H. 1990. Sea ways to Sielediba : changing patterns of navigation in the Indian ocean and their impact on the precolonial Sri Lanka. **Sri Lanka and the silk road of the sea.Bandaranayak**e, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(16) Indrapala, Karthigesu. 1963. The Nainativu Tamil inscription of Parakramabahu I. **University of Ceylon review vol. XXI. nos. 1.** Fernando, P. E. E. , W. J. F. Labrooy, K. W. Goonewardena (eds.). Peradeniya ; University of Ceylon.

(17) Indrapala, K. (ed.). 1971. **Epigraphia Tamilica vol. I part I**. Jaffna Archaeological Society.

(18) Indrapala, K. 1990. South Indian mercantile Communities in Ceylon, circa 950-1250. **Sri Lanka and the silk road of the sea**. Bandaranayake, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(19) Indrapala, K. 2005. **The evolution of an ethnic identity - The Tamils in Sri Lanka**. Sydny ; The South Asian Studies Centre.

(20) Karashima, N. 2002. South Indian and Sri Lankan in scriptions relating to the merchant guilds. **Ancient and medieval commercial activities in the Indian ocean ; Testimony of inscritions and ceramic sherds**. Karashima, N. (ed.). Japan ; Taisho University.

(21) Karashima, N. and Y. Subbarayalu. 2002 Ainuurruvar : A supra - local organization of South Indian and Sri Lankan merchants. **Ancient and medieval commercial activities in the Indian ocean ; Testimony of inscritions and ceramic sherds**. Karashima, N. (ed.). Japan ; Taisho University.

(22) Paranavitana, S. 1953. **Memoir of the Archaelogical Survey of Ceylon vol. VI**. Archaeological Survey of Ceylon.

(23) Paranavitana, S. 1956. **Sigiri graffiti - vol. II**. London ; Oxford University press.

(24) Paranavitana, S. 1960. Lankatilaka inscriptions. **University of Ceylon review vol. XVIII, nos. 1 and 2**. Kanapathipillai, K., N. A. Jayawickrama, K. N. Jayatilleke (eds.). Colombo ; Ceylon University press.

(25) Paranavitana, S. 1970. **Inscriptions of Ceylon vol. I.** Colombo ; Department of Archaelogy.

(26) Paranavitan,a S. 1983. **Inscriptions of Ceylon vol. II.** part I. Colombo ; Department of Archaelogy.

(27) Pathmanathan, S. 1984. The Nagaram of the Nanadesis in Sri Lanka Circa A.D. 1000 - 1300. **The Sri Lanka journal of humanities vol. x nos. 1 and 2.** Peris, Merlin. (ed.). University of Peradeniya.

(28) Pathmanathan, S. 2002. The Lankatilaka temple inscriptions of a merchant community. **Ancient and medieval commercial activities in the Indian Ocean ; Testimony of inscriptions and ceramic sherds**. Karishma, N. (ed.) Japan ; Taisho University.

(29) Pathmanathan, S. 2002. The Nanadesis in Anuradhapura : A unique bronze image of Virabhadra. **Ancient and medieval commercial activities in the Indian Ocean ; Testimony of inscriptions and ceramic sherds**. Karishma, N. (ed.) Japan ; Taisho University.

(30) Pathmanathan, S. 2002. Trade and urbanization in medieval Sri Lanka : The Virakoti inscription at Budumuttava. **Ancient and medieval commercial activities in the Indian Ocean ; Testimony of inscriptions and ceramic sherds**. Karishma, N. (ed.) Japan ; Taisho University.

(31) Ramayya, J. 1981 Madras museum plates of vema : A.D. 1345. **Epigraphia Indica vol. VIII**. Hultzsch, E. (ed.). Delhi : Archaeological survey of India.

(32) Shukri, M.A.M. 1990. Arabic (Kufic) inscriptions in Sri Lanka. **Sri Lanka and the silk road of the sea**.Bandaranayake, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(33) Silva, Roland. 2000. Development in ancient cities in Sri Lanka. **Reflections on a heritage vol. I part I**. Gunawardena, R.A.L.H. and others (eds.). Colombo ; Central Cultural fund.

(34) Silva, Roland and Jan bouzek. 1990. Mantai - A second Aricamedu : A note on Roman finds. **Sri Lanka and the silk road of the sea**. Bandaranayake, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(35) Siriweera, W.I. 1994. **A Study of the economic history of pre - modern Sri Lanka**. New Delhi ; Vikas publishing house.



(36) Somadeva, Raj. 2002. Some early miniature inscriptions of Sri Lanka. **Saddhamangala Karunaratne felicitation volume**. Dias, Malani and K.B.A. Edmund (eds.) Colombo 7 ; Archaelogical Survey department.

(37) Somadeva, Raj. 2006 **Urban origins in Southern Sri Lanka**. Sweden ; Uppsala University.

(38) Subbarayalu, Y. and N. Karashima. 2002. A trade guild inscription from Viharehinna Sri Lanka. **Ancient and medieval commercial activities in the Indian Ocean ; Testimony of inscriptions and ceramic sherds**. Karishma, N. (ed.) Japan ; Taisho University.

(39) Tampoe, Moria. 1990. Tracing the silk road of the sea : ceramic and other evidence from the partner ports of the West Indian ocean. **Sri Lanka and the silk road of the sea**.Bandaranayake, Senake, Lorna Dewaraja, Roland Silva, K.D.G. Wimalaratne (eds.). The Sri Lanka national Commission for UNESCO and the Central Cultural fund.

(40) Velluppillai, A. 1971. **Ceylon Tamil inscriptions part I**. Peradeniya.

(41) Velluppillai, A. 1972. **Ceylon Tamil inscriptions part II**. Peradeniya.

(42) Weerakkodi, D.P.M.1986. The foreign relations and trade of ancient Sri Lanka. **Silver jubilee commemoration volume of the University of Kelaniya.** Weerasinghe, S.G.M. and others (eds.). University of Kelaniya.

(43) Weerakkodi, D.P.M. 1997. **Taprobane**. Brepols Turnhout.

(44) Wickremasinghe, D.M.D.Z. (ed.) 1912. **Epigraphia Zeylanica vol. I**. London ; Oxford University press.

(45) Wickremasinghe, D.M.D.Z. (ed.) 1928. **Epigraphia Zeylanica vol. II.** London ; Oxford University press.

(46) Wickremasinghe, D.M.D.Z. and H.W. Codrington (eds.) 1933. **Epigraphia Zeylanica** vol. III. London ; Oxford University press.